

මාසික විශේෂාංගය - පුරාවිද්‍යාව

# සංවර්ධනය හා පුරාවස්තු




වස්තු කොල්ලකරුවන් ගේ කුඩාගෙඩි පහර ලත් පොතුවිල් පිළිමය



ආර්ථික සංවර්ධනය හා පුරාවස්තු සංරක්ෂණය යන්න දෙපැත්තක ගමන් කළ යුතු අංශ දෙකක් නොවේ. රටක ආර්ථික සංවර්ධනය වර්තමාන යුගයේ පැවැත්ම සඳහා පමණක් නොව අනාගත පැවැත්ම සඳහා ද සම්පත් කළමනාකරණයේ දී ඉතා වැදගත් වනු ඇත. මේ සඳහා භූමිය ප්‍රයෝජනයට ගැනීම මූලික කාර්යයක් වන්නේ ය. මේ නිසා කිසියම් සංවර්ධන කටයුත්තකදී රජය මැදිහත් වන විට විශේෂයෙන් ම එම භූමිය පුරාවිද්‍යා ස්ථාන හෝ පුරාවස්තු ඇති නැති බව තක්සේරු කිරීමේ ක්‍රියාවලියක් නීතිගත වූ ආකාරයෙන් මීට ඉහත දී තිබුණේ නැත. සංවර්ධන කටයුතු කෙරෙන අවස්ථාවල දී ඒ සඳහා පුරාවස්තු බිලිදීමට සිදුවුවහොත් අපේ යටගියාව විනාශ වී යෑමෙන් සිදුවන පාඩුව කිසිසේත්ම යළි ලබා ගත හැකි ක්‍රමයක් නැත. එසේනම් ඒ සඳහා සංවර්ධන කටයුත්තකට කිසියම් භූමියක් යොදා ගැනීමට පෙර ඒ පිළිබඳ පුරාවස්තු ගවේෂණ පෙර අගැයුම් වාර්තාවක් ද ලබා ගත යුතුයැයි පසුගිය වසර අග භාගයේදී පුරාවිද්‍යා නීතියක් සම්මත කරගන්නා ලදී. එම ඇගැයුම් වාර්තාව සකස් කිරීම සඳහා කිසියම් සංවර්ධන ව්‍යාපෘති සැලැස්මක දී ඒ සඳහා වැය වන මුදලින් 1% ක් වත් වෙන් කළ යුතු බවට මෙම නව නීතියෙන් ප්‍රකාශයට පත් කර ඇති මූලික කරුණකි. ඒ අනුව එම අගැයුම් වාර්තාව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මගින් ලබා දෙන තුරු එම සංවර්ධන කාර්යය ක්‍රියාත්මක කළ නොහැකි ය. අවශ්‍ය වුවහොත් එම යෝජිත බිමෙහි පර්යේෂණ කැණීමක් වුවද කළ යුතු වන්නේ ය. මේ වාතාවරණය මත මින් පසුව සංවර්ධන කටයුතුවලදී පුරාවස්තු විනාශවීම කිසිසේත් ම සිදුවන්නේ නැතැයි අපේක්ෂා කෙරේ. එසේ නීතිය වුවද මේ පිළිබඳව රටක පුරවැසියන් වශයෙන් රාජ්‍ය නිලධාරීන් පමණක් නොව සාමාන්‍ය පුරවැසියන් පවා දැඩි අවධානයකින් ක්‍රියා කළ යුතු වන බවද මෙහිදී සඳහන් කළ යුතුව ඇත. නීතිරීති පනවා ඇත්තේ ඒවා පිළිබඳ සැලකිලිමත්වී වැඩිදුරටත් ඒ පිළිබඳ ජනතා අවධානය යොමු කරවීමට යි. විනාශය වැලැක්වීමට ය. මේ නිසා නීති-රීති මගින් පමණක්ම රටක පුරාවස්තු සුරැකීම කළ නොහැකි බව අන්‍ය ක්ෂේත්‍ර පිළිබඳව සලකා බලන විට වුවද ඉතා පැහැදිලි කරුණක් වන්නේ ය.

අද අප රට තුළ ක්‍රියාත්මක වන සමාජ නීති-රීති ගැන සලකා බලන විට කෙසේ හෝ මුදල් උපයා ගැනීමේ සම්ප්‍රදය තුළ මිනිසා තුළින් සාරධර්ම ගිලිහී යාමේ මහා භයානක සෝදා පාලුවකට භාජනය වී ඇත. ඒ මහා විනාශය අද අප රටේ පෞරාණික දේපල හරහා ද හඹා යෑමේ ප්‍රවණතාවක් 1991 සිට ඉතා ශීඝ්‍ර ලෙසින් දක්නට ලැබුණි. එය පසුගිය කාලයේ දී දැඩි දඬුවම් හා ජනතාවට අවබෝධ කරදීමේ ක්‍රියාවලිය තුළින් තරමක් හෝ අඩු වී තිබූ නමුදු වෙසක් මාසය තුළදී අපේ පුරාවිද්‍යා ස්ථාන හා විහාර ආරාමවල බුදු පිළිම විනාශය වස්තුව පැහැර ගැනීමේ අරමුණෙන්ම පමණක් සිදු කරන්නේ දැයි තරමක



**ප්‍රථම පුරාවිද්‍යා කොමසාරිස් එච්. සී. පී. බෙල් මහතා**



**වෙහෙරගලින් හමු වූ අවලෝකිතේශ්වර බෝධිසත්ව පිළිමය**

සැකයක් හටගන්නට තරම් වූ කරුණු ඉදිරිපත් වී තිබුණි. මෙය සංවිධානාත්මක වූ පිරිසක් විසින් සිදු කරනු ලබන ක්‍රියාවලියක් දැයි විමසා බැලීම අද අප විසින් කළ යුතුව ඇතැයි ද බොහෝ දෙනෙකුගේ මතයයි. සමහරුන්ගේ මතය වී ඇත්තේ අන්‍යාගමිකයින් විසින් බෞද්ධ ජනතාවට සුබසාධන සැලසීමේ මුවාවෙන් ඔවුන් ඒ ඒ ආගම්වලට හරවා ගැනීමේ ඉතා රහසිගත ව්‍යාපාරයක් යන අතරේ මෙසේ බුදුපිළිම විනාශ කිරීමේ කාර්ය ඊට සමගාමීව සමාජය තුළ සිදු කෙරෙන බවයි. මෙය ඉතාමත් බැරෑරුම් ගැටළුවකි. අද සුළි සුළඟක් සේ ගම්දනවි සිසාරා යන මේ විනාශය නැවැත්වීමේ ආරක්ෂක ජාලයක් සැකසිය යුතුව ඇත. දැනටමත් නියෝජ්‍ය පොලිස්පතිවරයකුගේ ප්‍රධානත්වයෙන් පුරාවස්තු විනාශ කරන්නන්ට එරෙහිව වහාම ක්‍රියාත්මක කෙරෙන කාර්යාංශයක් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අනුග්‍රහයෙන් පිහිටුවා ඇත.

මේ සඳහා ජනතාවගේ පූර්ණ සහාය අවශ්‍ය වන්නේ ය. ජනතාවගේ අවධානයත් පූර්ණ සහායක් නොමැතිව නිලධාරීන්ගේ හෝ නීතිරීතිවල පිහිටෙන් කෙසේවත් මෙම පුරාවස්තු ආරක්ෂා කළ නොහැකි බව අද ඉතා පැහැදිලි ලෙසින් ම ප්‍රකාශ වී ඇති මතයක් වී ඇත. ❑